# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 නොවැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 90 යි		තැපැල් ගාස්තුව : ශත 25 යි

## 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 100/78.

**ජාතික තරුණ සේවා සභාවක් පිහිටුවීම සහ විධිමත් කිරීම සඳහා ද 1967 අංක 11 දරන ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත ඉවත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*ජාතික තරුණ සේවා සභාව පිහිටුවීම.*

2. 8 වන වගන්තිය යටතේ තත්කාලයෙහි සභාවේ සාමාජික යන් වන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික තරුණ සේවා සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

*සභාව සංස්ථාගත මණ්ඩලයක් විය යුතු බව.*

3. සභාව අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එය විසින් සහ එයට විරුද්ධව එහි සංස්ථාගත නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

*සභාවේ අරමුණු.*

4. ශ්‍රී ලංකාවේ තරුණයන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකි වන පරිදි, ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සහ විශේෂ යෙන් ම—

(අ) ජාතික හැඟීම පිළිබඳ උද්‍යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ සහ ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභි මානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම ;

(ආ) ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යොන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) තරුණයන් අතර තරඟකාරිත්වය සහ ජයග්‍රහණය පිළිබඳව හැඟීම් සඳහා දිරිගැන්වීම ;

(ඉ) තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් ලබාදීම ;

(ඊ) තරුණයන් අතර සංස්කෘතික, සාහිත්‍යමය සහ කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරිගැන්වීම ;

(උ) තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණ්‍යය සහ ක්‍රීඩා වර්ධනය සඳහා දිරිගැන්වීම ;

(ඌ) තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම ;

ඊ 45022—12,600 (79/10)

(එ) බාධිත තරුණයන්ට සහායවීම ;

(ඒ) රාජ්‍යයේ ආර්ථික සැකසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝකාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථා සැලසීම ;

(ඔ) ප්‍රතිපත්ති සැකසීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථා සැලසීම ;

(ඕ) තරුණ සංවිධාන පිහිටුවීම සහ තරුණ සුභසාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධානවලට සහායවීම ;

(ක) තරුණ සේවා ව්‍යාප්තිය සැලසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම ; සහ

(ග) එක් එක් තරුණයාගේ ආවේණික ලක්ෂණ වර්ධනය කිරීම සභාව පිහිටුවනු ලබන අරමුණු බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සභාවේ බලතල.

5. (1) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට, දැරීමට, කුලියට හෝ බද්දට ගැනීමට හෝ දීමට සහ ඔඩපනය කිරීමට හෝ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හෝ සභාවට බලය තිබිය යුතු ය :

එසේ වුව ද, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව සභාවේ නිශ්චල දේපළ කිසිවක් විකුණනු නොලැබිය යුතු ය.

(2) (අ) සභාවේ අරමුණුවලින් යම් අරමුණකට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ යම් කෘෂිකාර්මික, කාර්මික, වාණිජ, සමාජ හෝ මහජනෝපයෝගී ව්‍යවසායන්හි අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව යෙදීම ;

(ආ) සභාව විසින් කරනු ලබන හෝ සලස්වනු ලබන සේවා සඳහා ගාස්තු අය කිරීම ;

(ඇ) තරුණ සංවිධාන පිහිටුවා ඒවා ලියාපදිංචි කිරීම සහ ඒ සංවිධානවලට උපදෙස් දීම, තාක්ෂණික දැනුම සැලැස්වීම සහ මුදලින් ආධාර දීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි තරුණයන් අතර අන්‍යොන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙනත් රටවල ඒ සමාන තරුණ සංවිධාන සමඟ සහයෝගතාවය පෝෂණය කිරීම ;

(ඉ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව උචිත අන්තර් ජාතික තරුණ සංවිධානවල සාමාජිකත්වය ලබා ගැනීම ;

(ඊ) අවශ්‍ය වූ විට ජාතික හෝ අන්තර් ජාතික සංවිධානවල සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ තරුණයන්ට ස්වාර්ථයක් ඇති කරුණු පිළිබඳව සම්මේලන හා සම්මන්ත්‍රණ සම්නුග්‍රහ කිරීම සහ පැවැත්වීම ;

(උ) ජාතික සංවර්ධනය සහ ඊට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිර්මාණාත්මක සහභාගිත්වය සඳහා තරුණයන් පුහුණු කිරීම සහ ඉගැන්වීම ; සහ

(ඌ) ස්වකීය අරමුණු නිසි ලෙස ක්‍රියාවේ යෙදවීම පහසු කිරීම පිණිස සභාවේ මතය අනුව අවශ්‍ය වන වෙනත් එවැනි සියලු දේ කිරීම

සඳහා සභාවට බලය තිබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් නිශ්චල හෝ චංචල දේපළින් වූ ප්‍රදාන හෝ පරිත්‍යාග සභාව විසින් භාරගනු ලැබිය හැකි ය.

6. අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට සභාව යටත් විය යුතු ය.

*අමාත්‍යවරයාගේ විධානයන්ට සභාව යටත් විය යුතු බව.*

7. සභාව විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා පැවරීමට අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලැබිය හැකි සභාවේ යම් කර්තව්‍යයක්—

*පැවරීමේ බලය.*

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාට ; හෝ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත සභාවේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට

පවරනු ලැබිය හැකි ය.

8. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සභාව සමන්විත විය යුතු ය :—

*සභාවේ සංයුතිය.*

(අ) (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයකු විය යුතු අතර, ඔහු සභාවේ සභාපතිවරයා විය යුතු ය ;

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව තරුණ කටයුතු සම්බන්ධයෙන් ප්‍රවේදිතාවක් හෝ සම්බන්ධතාවක් ඇති අමාත්‍යාංශ සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු නියෝජනය කෙරෙන නිල සාමාජිකයන් නියමිත සංඛ්‍යාවක් ; සහ

(ඇ) වෙනත් සාමාජිකයන් නියමිත සංඛ්‍යාවක් :

එසේ වුව ද නිල සාමාජිකයන් සංඛ්‍යාව (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ වෙනත් සාමාජිකයන්ගේ සංඛ්‍යාව නොඉක්මවිය යුතු ය.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටී නම්, ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ සාමාජිකයකු ව සිටීමට හෝ සුදුසු නොවිය යුතු ය.

9. (1) සභාවේ සාමාජිකයකු, මිය යාම නිසා හෝ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි කලින් ධුරය අත්හරින්නේ නම් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

*සාමාජිකයකුගේ ධුර කාලය.*

(2) 10(1)(අ) වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීමේ හේතුව මත හැර, ධුරය අත් හරින යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

ධුරය අත් හැරීම.

**10.** (1) සභාවේ සාමාජිකයකු—

(අ) ඔහුගේ සාමාජිකත්වය අමාත්‍යවරයා විසින් අවසන් කරනු ලැබුවේ නම්; හෝ

(ආ) අමාත්‍යවරයා අමතන ලද ලිපියකින් තම ධුරයෙන් ඔහු ඉල්ලා අස්වන්නේ නම්; හෝ

ඒ සාමාජිකයා තම ධුරය අත්හැරිය යුතු ය.

(2) සභාවේ සාමාජිකයකු විසින් ධුරය අත්හරින හෝ ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඔහු ඉවත් කරනු ලබන හෝ අවස්ථාවක අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය. ඒ තැනැත්තා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකුට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) අසනීප වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට සභාවේ යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**11.** සභාවට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක දී සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් ආපසු ගෙවීම.

**12.** (1) සභාව විසින් හෝ සභාවට විරුද්ධව යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක් ඉදිරියට ගෙනෙනු ලැබූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරන ලද යම් වියදම් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තව ද එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ සභාවේ විධානය මත හෝ තමා විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් ඉදිරියේ සභාවේ හෝ එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදම්, ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ආපසු අය

කර ගනු ලබන්නේ නම් මිස, ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ආදිය.

13. (1) සභාවේ සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

(2) සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තැනැත්තාට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික සහ දීමනා ගෙවනු ලැබිය හැකි ය.

සභාව වෙනුවෙන් සාධන පත්‍ර අත් සන් කිරීම.

14. සභාව විසින් හෝ සභාව වෙනුවෙන් අත්සන් කිරීමට නියමිත සියලු සාධන පත්‍ර තත් කාර්යය සඳහා සභාව විසින් ලිඛිතව බලය දෙනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්.

15. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම් පැවැත්වීම, ඒ සඳහා ගණපූරණය සහ රැස්වීම්වල දී කටයුතු කිරීම සඳහා කාර්ය පරිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) සභාවේ යම් රැස්වීමක දී උද්ගතවන යම් ප්‍රශ්නයක් පැමිණ සිටින සාමාජිකයන් වැඩි දෙනකු විසින් තීරණය කළ යුතු අතර, ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් ඇති වුවහොත් සභාපතිවරයාට වදවන හෝ තීරක ඡන්දයක් තිබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන්.

16. අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර,' ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතු ය:—

(අ) සභාව විසින් අනුමත කරනු ලැබූ සියලු ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග ක්‍රියාවේ යෙදවීම;

(ආ) සභාවේ පොදු විධානයට යටත්ව, සභාවේ කටයුතු පරිපාලනය කිරීම සහ සභාවේ කාර්ය මණ්ඩලය පාලනය කිරීම;

(ඇ) සභාවේ රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීම සහ මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සභාව විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම; සහ

(ඈ) සභාව විසින් ඔහු වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම.

මූල මණ්ඩල පත් කිරීම.

**17.** (1) සභාවේ අරමුණු ක්‍රියාවේ යෙදවීමට සම්බන්ධ හෝ ආනුෂංගික වූ යම් විශේෂ කටයුත්තක හෝ කටයුතුවල පොදු වර්ධනය පිළිබඳ සභාවට උපදෙස් දීමේ සහ සහායවීමේ කාර්යය සඳහා සභාපතිවරයකුගෙන් සහ සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත මූල මණ්ඩල සභාව විසින් පත් කළ හැකි ය.

(2) යම් තැනැත්තකු, ඔහු සභාවේ සාමාජිකයකු වුව ද නොවුව ද (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ යම් මූල මණ්ඩලයකට පත් කිරීම සඳහා සුදුසු වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් මූල මණ්ඩලයක් හෝ මූල මණ්ඩලයක යම් සාමාජිකයකුගේ පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට සභාවට බලය තිබිය යුතු ය.

පුරප්පාඩුවක් ආදිය තිබීම පසුව සොයා ගනු ලැබුව ද සභාවේ හෝ මූල මණ්ඩලවල ක්‍රියා වලංගු බව.

**18.** සභාවේ හෝ යම් මූල මණ්ඩලයක යම් රැස්වීමක දී කරන ලද සියලු ක්‍රියා, එහි සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබූ බව හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් තිබූ බව හෝ එහි යම් සාමාජිකයකුට ඒ රැස්වීම පිළිබඳව දැනුම්දීමට පැහැර හැරීමක් සිදුවූ බව හෝ පසුව සොයා ගනු ලැබුව ද, අවස්ථාවෝචිත පරිදි එවැනි පුරප්පාඩුවක් නොතිබූ ලෙස හෝ ඒ සාමාජිකයා නිසි ලෙස පත් කරනු ලැබූ ලෙස හෝ දැනුම් දීමේ දී එවැනි පැහැර හැරීමක් සිදු නොවූ ලෙස හෝ වලංගු විය යුතු ය.

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, පාරිශ්‍රමික ගෙවීම ආදිය.

**19.** (1) ස්වකීය අරමුණු ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පාරිශ්‍රමික, සේවා කොන්දේසි සහ බඳවා ගැනීමේ ක්‍රම, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව සභාව විසින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**20.** (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ද කැමැත්ත ඇතිව, සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු අතර, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ කාර්ය මණ්ඩල

යට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ඉහත කී 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

ජාතික තරුණ සේවා සභාවේ නිලධරයන් සහ සේවකයන්.

**21.** මේ පනතේ 35 වන වගන්තියෙන්, 1967 අංක 11 දරන ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත ඉවත් කරනු ලැබුව ද, ඒ පනත යටතේ පිහිටුවනු ලැබුවා වූ ද මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ධුර දරන්නා වූ ද ජාතික තරුණ සේවා සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන්, ඉවත් කරනු ලැබූ පනත යටතේ ඔවුන්ට අදාළ වූ නියම සහ කොන්දේසි මත ම, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික තරුණ සේවා සභාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ජාතික තරුණ සේවා සභාවේ වත්කම් හා බැරකම් මේ පනත යටතේ පිහිටුවන ලද සභාවට පැවරීම.

**22.** මේ පනතේ 35 වන වගන්තියෙන්, 1967 අංක 11 දරන ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත ඉවත් කරනු ලැබුව ද, ඉවත් කරනු ලැබූ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික තරුණ සේවා සභාවේ චංචල සහ නිශ්චල දේපළ සහ අරමුදල්වල ඇති මුදල් ඇතුළු සියලු වත්කම් හා බැරකම් මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික තරුණ සේවා සභාව සතුවිය යුතු ය.

සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**23.** සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ගිවිසුම්වල කාර්ය සඳහා සභාවට කරනු ලබන සේවය ආණ්ඩුවට කරනු ලබන සේවය වශයෙන් සැලකිය යුතු බව.

**24.** නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹී යම් තැනැත්තකු සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

ආණ්ඩුව විසින් දෙනු ලබන ප්‍රදාන.

**25.** (1) සභාවේ ප්‍රාග්ධනය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් ඒකාබද්ධ අරමුදලින් ප්‍රදානය කරනු ලබන්නා වූ ද, මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(2) සභාවේ ප්‍රාග්ධනය යම් විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාණයන්ගෙන් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

සභාවේ අරමුදල.

**26.** (1) සභාවට, සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) කවර වූ හෝ ප්‍රභවයකින් වූ පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ;

(ආ) සභාව විසින් ඉටු කරනු ලැබූ හෝ සලසනු ලැබූ සේවා සඳහා අය කරනු ලැබූ ගාස්තු ;

(ඇ) සභාව විසින් ක්‍රියාවේ යොදවනු ලැබූ යම් කටයුතු වලින් ලැබෙන ආදායම ; සහ

(ඈ) මේ පනතින් හෝ පනත යටතේ ඒ අරමුදලට ගෙවීමට නියම කරනු ලැබූ ගෙවීම්

යන ආකාරයෙන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

දේපළ ආදිය යෙදවීම.

27. සභාව විසින් අත්කර ගනු ලැබූ හෝ දරනු ලැබූ චංචල සහ නිශ්චල සියලු දේපළ සහ සභාව විසින් භාර ගනු ලැබූ සියලු ප්‍රදාන සහ පරිත්‍යාග සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් ස්වකීය අරමුණු වැඩි දියුණු කිරීම සඳහා සභාව විසින් පාවිච්චි කරනු ලැබිය යුතු අතර, යොදවනු ලැබිය යුතු ය.

සභාවේ ගිණුම් සහ මුදල් වර්ෂය.

28. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ක්‍රමයට සහ ආකාරයට ස්වකීය ගිණුම් තැබීමට සභාව විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) සභාවේ ගිණුම් පොත් සභාවේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

(3) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

සභාවේ ගිණුම් විගණනය කිරීම.

29. (1) සභාව විසින් ස්වකීය ගිණුම් එක් එක් වර්ෂයේ දී, විගණකාධිපතිවරයා ලවා විගණනය කරගත යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ වුව ද සභාවේ ගිණුම් විගණනය කිරීම සඳහා, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා විගණකාධිපතිවරයා විමසා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කරනු ලැබිය හැකි ය. එවැනි පත්කිරීමක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ විට, ඒ විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය හෝ සේවාවන් සභාව සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව, විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දන්වනු ලැබිය හැකි අතර, එසේ දන්වනු ලැබූ විට, ඒ විගණකවරයා හෝ විගණකවරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (අ) විගණකාධිපතිවරයා විසින්, සභාවේ ගිණුම් විගණනය කිරීමෙහි ලා තමාට සහායවීමේ කාර්යය සඳහා තමාගේ මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු, සුදුසුකම් ලත් යම් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය ලබා ගත හැකි ය.

(ආ) සභාවේ ගිණුම් පිළිබඳ විගණනයට අදාළ යම් තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටළුවක් පරීක්ෂා කිරීමේ දී—

(i) සභාවේ සේවානියුක්තයකු නොවන තැනැත්තකුගේ ; හෝ

(ii) සභාවේ කටයුතු කළමනාකරණයෙහි ලා කවර හෝ සම්බන්ධතාවක් ඇති ආයතනයක් නොවන යම් තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යාත්මක ආයතනයක

සභාය ලබා ගැනීම අවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එපරිද්දෙන ඒ සේවය ලබා ගත හැකි ය. තව ද ඒ තැනැත්තා හෝ ආයතනය විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(4) (අ) විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත තකුට, සභාවේ ගිණුම් විගණනය කිරීමේ දී—

(i) සභාවේ සියලු පොත පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලේඛන ලබා ගැනීමට ද;

(ii) සභාවේ ගබඩාවලට සහ එහි වෙනත් දේපළවලට පිවිසීමට; සහ

(iii) සභාවේ ගිණුම් විගණනය කිරීම ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු සහ කරුණු පැහැදිලි කිරීම් සභාව මගින් හෝ එහි නිලධාරීන් මගින් සපයා ගනු ලැබීමට

හිමිකම තිබිය යුතු ය.

(ආ) සභාවේ ගිණුම් විගණනය කිරීම සඳහා පත් කරන ලද සුදුසුකම් ලත් සෑම විගණකවරයකුට ම නැතහොත් එවැනි විගණක වරයකු විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට, සභාව සම්බන්ධ යෙන් සමාන ලෙස එසේ ලබා ගැනීමට සහ පිවිසීමට ද, තොරතුරු ලබා ගැනීමට සහ කරුණු පැහැදිලි කරවා ගැනීමට ද හිමිකමක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යයන් සඳහා " සුදුසුකම් ලත් විගණක වරයා " යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරිවරයන්ගේ ව්‍යාපාර ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධි කාරීන්ගේ ආයතනයෙහි හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතික යක් දරන්නේ ද එවැනි ගණකාධිකාරිවරයන්ගේ ව්‍යාපාර ආයතනයක්

අදහස් වේ.

30. (1) විගණකාධිපතිවරයා සභාවේ ගිණුම් පරීක්ෂා කොට ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. විගණකාධිපති වරයාගේ වාර්තාව.

(2) විගණකාධිපතිවරයා විසින් තම වාර්තාව සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සුදුසුකම් ලත් සෑම විගණකවරයකු විසින් ම තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව සමග වාර්ෂික ගිණුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

**31.** එක් එක් වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට ඒ වාර්තාව ද, ඒ වාර්තාව අදාළ වන්නා වූ ආදායම සහ වියදම පිළිබඳ ගිණුම සහ ශේෂ පත්‍රය ද සමග ආදායම සහ වියදම පිළිබඳ ගිණුම සහ ශේෂ පත්‍රය සාදනු ලැබුවේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා සභාවේ වැඩ පිළිබඳව සභාව විසින් සකස් කරන ලද වාර්තාවක් ද අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ ගිණුම් සහ වාර්තා අදාළ වන්නේ යම් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර ඒවායෙහි පිටපත් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම සඳහා ඔහු විසින් සලස්වනු ලැබිය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

**32.** මේ පනතින් අන්‍යාකාරයෙන් විධිවිධාන විශේෂයෙන් සලස්වනු ලැබුවේ නම් මිස, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන සභාවේ මුදල් පාලනයට සහ ගිණුම්වලට සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**33.** සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

නියෝග.

**34.** (1) මේ පනතින් නියම කරනු ලැබීමට නියමිත කරුණු සඳහා සහ මේ පනතින් නියෝග සාදනු ලැබීමට බලය දෙනු ලැබූ යම් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැක් ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

35. 1967 අංක 11 දරන ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1967 අංක 11 දරන පනත ඉවත් කිරීම.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"මූල මණ්ඩලය" යන්නෙන් මේ පනත යටතේ සභාව විසින් පත් කරන ලද මූල මණ්ඩලයක් අදහස් වේ;

"නියමිත" යන්නෙන් නියෝගයෙන් නියම කරන ලද යනුවෙන් අදහස් වේ;

"තරුණ" යන්නට ස්ත්‍රියක් ඇතුළත් වේ; සහ

"ඉවත් කරනු ලැබූ පනත" යන්නෙන් 1967 අංක 11 දරන ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත අදහස් වේ.